# පන්ති කාමර සංස්කෘතියේ විවිධත්වය

එස්. ගලගමගේ

පාසල් සංස්කෘතිය මෙන් ම, පන්ති කාමරයට ආවේනිකව ගොඩ නැගෙන ජීවන රටා පන්ති කාමර සංස්කෘතිය ලෙස හැඳින්විය හැකි ය. පන්ති කාමරයේ එදිනෙදා කටයුතු සිදුවන ආකාරය අඛණ්ඩව සිදුවන විට ඒවා ජීවන පුරුදු බවට පත් වීම නොවැළැක්විය හැකි දෙයකි. කලක් තිස්සේ නිරායාසයෙන් ගොඩ නැගී ඇති රටාව හිතකර හෝ අහිතකර වුව ද, ක්ෂණිකව, ප්‍රබල ලෙස වෙනස් කිරීම අපහසු සංස්කෘතියක් බවට පත් වේ. පන්ති කාමරයේ සමස්ත ක්‍රියාවලිය පන්ති කාමර සංස්කෘතිය වේ. ඉගෙනුම් ඉගැන්වීම්, හැසිරීම් රටා, සම්ප්‍රදාය, කතාබහ, ආචාර විධි, මානව සබඳතා, නීතිරීති හා භෞතික වාතාවරණය ආදි සියල්ල එයට අයත් වේ. ''නිර්මාණාත්මක පන්ති කාමර වාතාවරණය, භෞතික පරිසරය, චිත්තවේගී වාතාවරණය, චර්යා, ක්‍රියාකාරකම් නම්‍යශීලී නිර්මාණාත්මක චින්තනය, ධෛර්යමත් කිරීම, ප්‍රශ්න ඇසීම් සහ ඒවාට විසඳුම් සෙවීමට ගන්නා උත්සාහය සහ සුරක්ෂිත බව මෙන් ම, උද්යෝගී හෝ උදාසීන ක්‍රියාකාරීත්වයක් සහිත තත්වයක්'' පන්ති කාමර සංස්කෘතිය ලෙස ''ස්ටාර්කෝ, (2013)'' නිර්වචනය කර ඇත. භෞතික හා අභෞතික සමස්ත පන්ති කාමර වාතාවරණය එයට අයත් වේ. මේ නිසා පන්ති කාමර වාතාවරණය, පන්ති කාමර පරිසරය, පන්ති කාමර සමාජ දේශගුණය ලෙස ද ව්‍යවහාර කළ හැකි ය.

පන්ති කාමර සංස්කෘතිය පාසලේ උප සංස්කෘතියකි. පාසලින් පාසලට මෙන් ම, එකම පාසලක පන්තියෙන් පන්තියට වෙනස් විය හැකි ය. ප්‍රාථමික හා ද්විතීයික අංශවල පන්ති කාමර සංස්කෘතියේ වෙනසක් පැවතිය හැකි අතර, එකම පාසලක පන්ති කාමර සංස්කෘතියේ පොදු අංග ලක්ෂණ ද විය හැකි ය. මේ අනුව පාසලට පොදු වූ නීතිරීති චර්යා ඇසුරින් ගොඩනැගී ඇති පොදු ලක්ෂණ මෙන්ම, පන්ති කාමරය හා එහි සිටින සිසුන්ගේ ස්වභාවය මත ගොඩනැගී ඇති සුවිශේෂ ලක්ෂණ ද අන්තර්ගත වේ. ඇඳුම්

පැලඳුම්, ආචාර විධි, නීතිරීති ආදිය පාසලට පොදු ගුණාංග ලෙස පන්ති කාමරයේ ක්‍රියාත්මක විය හැකි ය. එහෙත් ඊට වඩා කැපී පෙනෙන ලෙස සිසුන්ගේ හැසිරීම් රටාව පන්තියෙන් පන්තියට සුවිශේෂ වේ. සිරිත් විරිත්, පැමිණෙන ආකාරය, මෝස්තර, ඉගෙනුම් රටා අනුව එකම පාසලේ විවිධ පන්ති කාමර සංස්කෘතියක් පැවතිය හැකි ය.

පන්ති කාමර සංස්කෘතියේ විවිධත්වයට සාධක රාශියක් බලපෑ හැකි ය. සිසුන්ගේ සමාජ ආර්ථික මට්ටම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, පාසල තුළ මෙන්ම පිටත සබඳතා, විවිධ ක්‍රියාකාරකම් පාසල් සංස්කෘතියට මෙන්ම, පන්ති කාමර සංස්කෘතියේ විවිධත්වයට ද බලපායි. එහි දී විශේෂයෙන් පන්ති කාමරයට සුවිශේෂව බලපාන සාධක මෙහි දී වඩාත් වැදගත් වේ.

- පන්ති කාමරයේ සබඳතා රටාව (ගුරු-සිසු, සිසු-සිසු) පන්තිය තුළ හා පිටත සබඳතා (සමාන්තර පන්ති, වෙනත් පන්ති, කාර්යය මණ්ඩල)
- සිසුන්ගේ විවිධත්වය (ස්ත්‍රී පුරුෂ, ජාති, ආගම්, සමාජ ආර්ථික පන්ති, සාධන මට්ටම, ලැදියා අවශ්‍යතා)
- පන්තියේ ශිෂ්‍ය ප්‍රමාණය
- ගුරුවරයාගේ නායකත්ව ශෛලිය
- පන්ති කාමරයේ භෞතික වාතාවරණය (ඉඩකඩ, පිළිවෙල, උපකරණ, වෙනත් සම්පත්)

මේ අනුව පන්ති කාමරයේ භෞතික මෙන්ම, අභෞතික සංස්කෘතියක් පැවතිය හැකි ය. එනිසා පන්තියෙන් පන්තියට සංස්කෘතිය සුවිශේෂ වේ. මෙහි දී සිසුන් අයත් සමාජ ආර්ථික මට්ටම ප්‍රබල සාධකයක් ලෙස බලපායි. ඒ අනුව බොහෝ සිසුන්ගේ කතාබහ, විනෝදාංශ, ශිෂ්‍ය සබඳතා, නායකත්ව කුසලතා, සාමූහික ක්‍රියාකාරකම් තීරණය වේ. මේ නිසා ප්‍රායෝගික ලෙස එක සමාන පන්ති කාමර සංස්කෘතියක් එක් පාසලක වුව ද, බොහෝ විට අපේක්ෂා කළ නොහැකි ය.

පන්ති කාමරයෙන් පන්ති කාමරයට සංස්කෘතියේ විවිධත්වයක් පැවතීම, මෙම සංකල්පය සමාජවිද්‍යාත්මක චින්තනයකින් අධ්‍යයනයට යොමු වී ඇත. පන්ති කාමර සංස්කෘතියේ අදාළ විවිධත්වය මෙන්ම, අදාළ නොවන විවිධත්වයක් පැවතිය හැකි ය. විෂයමාලාව, අරමුණු, සිසුන්ගේ වයස් මට්ටම ආදිය අනුව විවිධත්වය අදාළ මෙන්ම, සාධාරණීකරණය කළ හැකි දෙයකි. නමුත් සිසුන්ගේ සමාජ පන්තිය, ජාතිය, කුලය, පාසල හා ශිෂ්‍ය සාධන මට්ටම් අනුව විවිධත්වයක් පවතින්නේ නම් එය අදාළ නොවන සාධාරණීකරණය කළ නොහැකි දෙයකි. විශේෂයෙන්ම සමාන්තර පන්ති අතරේ පවා විවිධ සංස්කෘතීන් පවතින විට එය ප්‍රබල ගැටලුවක් ලෙස කැපී පෙනේ. මේ සඳහා භෞතික හා සමාජ පරිසර සාධක ප්‍රබල ලෙස බලපෑ හැකි ය. පන්ති කාමරය පිහිටි ස්ථානය, ඉඩකඩ, උපකරණ, වාතාශ්‍රය, ආලෝකය ආදිය මෙන්ම ගුරු-ශිෂ්‍ය සබඳතාව, සිසු-සිසු සබඳතාව, ආචාර සමාචාර විධි, නායකත්වය ආදිය ද බලපෑ හැකි ය.

**නායකත්ව රටාව හා පන්ති කාමර සංස්කෘතිය**

| නායකත්ව ශෛලිය | ගුරුවරයාගේ ස්වභාවය | සිසුන්ගේ ස්වභාවය |
|---|---|---|
| ඒකාධිපති (ආඥාදායක) | අණ කිරීම, නියෝග කිරීම, වැඩ තනිවම තීරණය කිරීම, සිසුන්ට සවන් නොදීම, සුළු වරදට පවා දඬුවම් දීම, සිසුන් සමග සබඳතා නොපැවැත්වීම. | බිය සුළු බව, ස්ව කැමැත්තෙන් ඉදිරිපත් නොවීම, වගකීම් නොදැරීම, සාමූහිකව ක්‍රියා නොකිරීම, තරගකාරී බව, නායකයන් සිටින විට පමණක් වැඩෙහි යෙදීම. |
| ප්‍රජාතන්ත්‍රවාදී (සහභාගිත්ව) | සිසුන්ට සවන් දීම, තීරණ ගැනීමේදී ශිෂ්‍ය මතය ගරු කිරීම, වගකීම් පැවරීම, සිසුන් ස්ථම්භනය කිරීම, ශිෂ්‍ය අවශ්‍යතා පිළිබඳ අවධානය. | ඉදිරිපත් වීම, වගකීම් දැරීම, සාමූහිකව ක්‍රියා කිරීම, අන් අයගේ අදහස්වලට ගරු කිරීම, කැපවීම, නායකයා නොමැති වුව ද වගකීම් ඉටු කිරීම, සතුටින් සිටීම. |
| වන්නාටවාදී (පූර්ණ නිදහස්) | විෂය හෝ තම භූමිකාව පිළිබඳ ව අවධානය යොමු නොකිරීම, සිසුන් ගැන සොයා නොබැලීම, ශිෂ්‍ය අවශ්‍යතා ගැන අවධානය යොමු නොකිරීම, අලස බව, කැපවීමක් නොවීම, සිසුන් සමඟ සබඳතා නොවීම. | ඉගෙනුම පිළිබඳව අවධානය යොමු නොකිරීම, වැඩ පිළිබඳ සැලසුමක් නොවීම, සාමූහිකව කටයුතු නොකිරීම, අලස බව. |

පන්ති කාමර සංස්කෘතියේ විවිධත්වයෙන් සිසුන්ට සමාන අධ්‍යාපන අවස්ථා නොලැබී යාම ප්‍රබල ගැටලුවක් විය හැකි ය. විවිධ හැකියා හා රුචිකත්වයක් පවතින සිසුන්ට අධ්‍යාපන අවස්ථාවලින් ඉහළ ප්‍රාප්ත මට්ටම් කරා අවතීර්ණ වීමට අදාළ පන්තියේ සංස්කෘතිය බාධා විය හැකි ය. ගුරුවරයාගේ චරිතාංග හා නායකත්ව ශෛලිය පන්ති කාමර සංස්කෘතියට තීරණාත්මකව බලපාන සාධකයකි. ලෙවින්, ලිපිට් හා වයිට් (Levin, Lippitt and White, 1998) දක්වන අන්දමට පන්ති කාමරයේ ගුරුවරයාට ආවේනිකව පවතින නායකත්ව ශෛලි තුනක් වේ. ඒවා ඒකාධිපති, ප්‍රජාතන්ත්‍රවාදී හා වන්නාටවාදී ලෙස නම් කර ඇත. විවිධ නායකත්ව රටාව අනුව ගුරුවරයාගේ ගති ලක්ෂණ හා සිසුන්ගේ චර්යා රටාව සැකසෙන අන්දම ලෙවින් ඇතුළු පිරිස (Levin et al. 2000) වෙන් කර හඳුනාගෙන ඇත. පන්ති කාමරයක ප්‍රජාතන්ත්‍රවාදී වාතාවරණයක් තිබීම සිසුන්ගේ අධ්‍යාපනයට හිතකර වන බව ''රිචඩ්සන් (2001)'' මෙන් ම, ''ලෙවින් ඇතුළු පිරිස (2006)'' නිගමනය කර ඇත. ගුරුවරයා විසින් ප්‍රජාතන්ත්‍රවාදී වාතාවරණයක් ගොඩ නැගීම ශිෂ්‍ය සාධනයට මෙන් ම, මනෝ පෞරුෂීය හා නායකත්ව ගුණාංග සංවර්ධනයට ද උපයෝගී වන බව දක්වා ඇත.

ගුරුවරයාගේ නායකත්ව ගති ලක්ෂණ අනුව පන්ති කාමරයේ සමාජ වාතාවරණය හෙවත් සංස්කෘතිය තීරණය වන අතර, සිසුන්ගේ ගති ලක්ෂණ, සම්බන්ධතා ආදිය ද ඒ අනුව විෂමාකාර වීම ප්‍රබල සමාජ ගැටලුවකි. අනාගත චර්යා රටාව ද ඒ අනුව ගොඩ නැගීම නොවැළැක්විය හැකි ය. දෙමාපිය, ගුරු හා ශිෂ්‍ය සම්බන්ධතා ස්වභාවය ද පන්ති කාමර සංස්කෘතිය විවිධාකාර වීමට බලපායි. ඇතැම් පන්ති කාමරවල දෙමාපිය ගරු සබඳතාව ශක්තිමත් වුව ද, තවත් පන්තියක දුර්වල සබඳතාවක් විය හැකි ය. මේ නිසා සිසු-සිසු සබඳතාවලට ද එය බාධාවක් විය හැකි ය. සියලු සබඳතා ශක්තිමත් වන විට ගැටලුවක් නොවූවත්, බොහෝ විට සබඳතා හීන වීම යහපත් සංස්කෘතියකට ගැටලුවක් වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට හිතකරව මෙන් ම, අහිතකරව පන්ති කාමරයට ආවේණික රටාව බලපාන්නේදැයි සොයා බැලිය යුතුය. පන්ති කාමර සංස්කෘතිය සිසුන්ට හා ගුරුවරුන්ට නිතැතින් ම බලපාන බව ''ලොරින් හා ඇන්ඩර්සන්, (1999)'' පෙන්වා දී ඇත.

සිසුන් නිත්‍ය වශයෙන් ම ඉගෙන ගන්නා දෙයට හා ප්‍රමාණයටත් ඒ අනුව බලපෑමක් සිදු වේ. පන්ති කාමරයේ භෞතික පරිසරය බාධාවක් නොවන පරිදි ගුරුවරයා හා ශිෂ්‍යයා අතර සන්නිවේදන කටයුතු සිදු කළ හැකි විය යුතුය. එසේ ම පන්ති කාමරය තුළ විනය විරෝධී ක්‍රියා ඇති වීමට ඉගෙනුම් පරිසරය ප්‍රියමනාප නොවීම ප්‍රධාන හේතුවක් බව ''වෙයින්ස්ටීන්, (1992)'' ඇමරිකාවේ පන්ති කාමර සංස්කෘතිය ඉගෙනුමට බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයකින් හඳුනාගෙන ඇත. සිසුන්ට ස්වයං පාලනයක් නොමැති වීමෙන් විනය ගැටලු ඇතිවන නිසා එවැනි පාලනයකට සුදුසු ක්‍රමවේද පන්ති කාමර සංස්කෘතිය තුළ හුරු පුරුදු කළ යුතු ය.

පන්ති කාමරයක හොඳ ඉගෙනුම් සංස්කෘතියක් ගොඩ නැගී තිබීම අධ්‍යාපන ක්‍රියාවලියට බෙහෙවින් හිතකර බව හඳුනාගෙන ඇත. කනිෂ්ඨ, ද්විතීයික අවදියේ දී ශිෂ්‍ය කේන්ද්‍රීය සම වයස් කාණ්ඩ ඉගෙනීමට හුරු පුරුදු කිරීමෙන් සක්‍රීය ඉගෙනුමක් සිදුවන බව ''කුඩලිගම (1985)'' හඳුනාගෙන ඇත. එසේම ඉගෙනීමට ඇති රුචිකත්වය සිසුන් අනුගමනය කරන ඉගෙනුම් පුරුදු මත රඳා පවතින බව ''සේනාධීර (1994)'' මහනුවර පාසල් ඇසුරින් කරන ලද අධ්‍යයනයකින් ද අනාවරණය කර ඇත. ඉගෙනුම් පුරුදු හා ඉගෙනුම් ශෛලි සිසුන්ගෙන් සිසුන්ට මෙන්ම, පන්ති කාමරයට ආවේණිකව ද විවිධත්වයක් පැවතිය හැකි ය. සිසුන් ප්‍රශ්න කරන ආකාරය, ක්‍රියාකාරකම්වල නිරත වන අයුරු, පාඩම් කරන ආකාරය, දැනුම බෙදා ගන්නා ආකාරය හා සවන් දෙන ආකාරය අනුව ඉගෙනුම් පුරුදු හා ශෛලි ගොඩනැගේ. ගුරුවරුන්ගේ ඉගැන්වීම් පුරුදු හා ශෛලීන් ද, ගුරුවරයාගෙන් ගුරුවරයාට මෙන්ම, පන්ති කාමරයට අනුව ද විවිධත්වයන්ගෙන් යුක්ත වන විට ඉහත ගැටලුව තව තවත් තීව්‍ර වේ. සිසුන්ගේ ඉගෙනුම් පුරුදු හා ශෛලිවලට, ගුරුවරයාගේ ඉගැන්වීම් පුරුදු හා ශෛලිවල ගැළපීම මත අධ්‍යාපන කටයුතු තීරණය වන බව හඳුනාගෙන ඇත. මෙවන් අධ්‍යාපන මූලධර්ම යථාර්ථයක් කර ගැනීම සඳහා පන්ති කාමරයක හොඳ ඉගෙනුම් හා ඉගැන්වීම් සංස්කෘතියක් ගොඩනගා ගත යුතු ය.

බහු සංස්කෘතික අධ්‍යාපනයක් ක්‍රියාත්මක වන පන්ති කාමරයක සංස්කෘතිය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බෙහෙවින් බලපායි. එහි

දී බහු සංස්කෘතික සාක්ෂරතාව (Multicultural Literacy) නොමැති ගුරුවරයකු සිටින පන්ති කාමරයක ගොඩනැගෙන සංස්කෘතිය අතිශයින් ගැටලු සහගත විය හැකි ය. දහස් ගණනින් සංක්‍රමණික හා සරණාගත සිසුන්ගෙන් යුක්ත ඇමරිකානු පාසල්වල පන්ති කාමරයක් ''සංස්කෘතික බඳුනක් (Cultural Petri-dish)'' බව අවධාරණය කර ඇත. එහි ඉංග්‍රීසි බස කතා කරන අයට ප්‍රමුඛත්වය ලබා දීම ගැටලුකි. එනිසා බහු සංස්කෘතික පන්ති කාමරයක ඇති විවිධතාව හඳුනාගෙන ගුරුවරයා ක්‍රියා කළ යුතු ය. එවැනි පසුබිමක අන්තර්කරණය වූ පන්ති කාමරයක් (Inclusive Classroom) ගොඩ නැගීමට අදාළ දැනුම, හැකියා හා ආකල්ප ගුරුවරයාට අත්‍යවශ්‍ය වේ. බහු සංස්කෘතික පන්ති කාමරයක විවිධතා හඳුනා ගැනීම, ඒවාට ගරු කිරීම, විවිධ භාෂා දැනුම, විවිධ සංස්කෘති හඳුනා ගැනීම සමග තම අනන්‍යතාව පවත්වා ගැනීම වැනි අනාගත පුරවැසි භූමිකාවට සිසුන් පෙළ ගැන්වීම බෙහෙවින් ඵලදායි වේ. බහු සංස්කෘතික තත්වයක් ම නොවූවත්, සාමාන්‍ය පන්ති කාමරයක පවතින විවිධත්වය තුළින් ඒකීයත්වයට හුරු පුරුදු කරන සංස්කෘතියකට ඉහත ක්‍රියාමාර්ග ආදර්ශයට ගත හැකි ය.

පවතින පන්ති කාමර සංස්කෘතිය යථාර්ථවාදීව හඳුනා ගැනීම හොඳ සංස්කෘතියක් ගොඩ නැගීමට බෙහෙවින් වැදගත් වේ. පන්ති කාමර සංස්කෘතිය පිළිබඳ ''කාල් මේස් (1994)'' කරන ලද අධ්‍යයනයක දී විදුහල්පති, ගුරු සංජානනය මතු කරගෙන ඇත. පන්ති කාමර සංස්කෘතිය යනු කුමක් ද? යන්නට දී ඇති ප්‍රතිචාර පහත දැක්වේ. පන්ති කාමරයේ සමස්ත තත්වයයි. පන්ති කාමරයේ ගුරු-සිසු ආකල්පයන් ය. පොදු සංස්කෘතිය සකසන්නක් මෙන්ම, සමානාත්මතාව ආරක්ෂා කරන්නකි. මෙවැනි හඳුනා ගැනීම් ඉක්මවා ගොස් ඉගෙනීම, ඉගැන්වීම සිදුවන ආකාරය ද යථා පරිදි හඳුනාගත යුතුය. හිතකර පන්ති කාමර සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා ගුරුවරයාට උපයෝගී වන කරුණු අටක් ''කයි සහ එන්ඩික්ට් (2004)'' විසින් හඳුන්වා දී ඇත.

- සියලු සිසුන්ට තමා පන්ති කාමරයට අයත් බව දැනෙන හැඟීම
- ගුරුවරයා ආදර්ශවත් වීම

- නිර්මාණශීලී වීමට උනන්දු කරවීම
- සිසුන්ගේ ප්‍රබලතා හා දුලබතා හඳුනා ගැනීම
- විනෝදාස්වාදයට මොහොතක් කාල පරිච්ඡේදයෙන් යොදා ගැනීම
- සෞඛ්‍ය සම්පන්න බව හා ආරක්ෂාව පිළිබඳ මග පෙන්වීම
- නායකත්වයට හා නායකයන් පත් කර ගැනීමට සාධාරණ අවස්ථා ලබා දීම
- ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඇගයීම

ධනාත්මක පන්ති කාමර සංස්කෘතියක මනා වූ පන්ති කාමර කළමනාකරණයක් ද පවතින බව අධ්‍යයන රැසකින් හඳුනාගෙන ඇත. ප්‍රමාණවත් ඉඩකඩ ඇති පන්ති කාමරවල මනා කළමනාකරණය හා ශක්තිමත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සිදුවන අතර, අවකාශය මදිකම ශිෂ්‍ය අසතුට හා ආක්‍රමණශීලී චර්යා වර්ධනයෙන් ඉගෙනීම අඩු වන බවත්, ''පෝලා (1996)'' ඇමරිකාවේ පාසල් ඇසුරින් කරන ලද අධ්‍යයනයකින් අනාවරණය කෙරේ.

පවතින යහපත් හා අයහපත් ලක්ෂණ හඳුනාගෙන ක්‍රම ක්‍රමයෙන් අයහපත් අංගවලින් මිදී යහපත් අංග සංවර්ධනය කළ යුතුය. ඒ සඳහා පන්ති කාමරයට ආවේණික ප්‍රතිමාන හා සාරධර්ම ගුරුවරයාගේ නායකත්වයෙන් ගොඩ නගා ගැනීම අත්‍යවශ්‍ය වේ. ප්‍රශ්න නගන ආකාරය, ප්‍රතිචාර දෙන ආකාරය, ඇගයීම සිදු කරන ආකාරය, උපකාර කරන අයුරු, මග පෙන්වන අයුරු, සටහන් තබා ගන්නා අයුරු, නොපැමිණි සිසුන්ට සටහන් ලබා දෙන ආකාරය ආදිය සිසුන්ගේ මෙන්ම, ගුරුවරුන්ගේ ද පුරුද්දක් බවට පත් විය යුතු ය. පන්ති කාමරයක අසුන් ගෙන ඇති ආකාරය සතියෙන් සතිය හෝ දිනපතා හෝ චක්‍රාකාරව මාරුවන රටාවක් ගොඩ නගා ගැනීමෙන් භෞතික වාතාවරණයෙන් සිදුවන ගැටලු ද අවම කර සාධාරණ අධ්‍යාපන අවස්ථා සැලසීමට හැකි පන්ති කාමර සංස්කෘතියක් සංවර්ධනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


ගලගමගේ, එස්. (2017). *අධ්‍යාපන සමාජවිද්‍යා මූලධර්ම.* (දෙවන මුද්‍රණය). පන්නිපිටිය: කර්තෘ ප්‍රකාශන.

ගලගමගේ, එස්. (1995). *තෝරාගත් පාසලක පාසල් සංස්කෘතිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.* (අධ්‍යාපනපති අප්‍රකාශිත නිබන්ධය), කොළඹ විශ්වවිද්‍යාලය.

ගලගමගේ, එස්. (2020). *අධ්‍යාපන සමාජවිද්‍යා චින්තන.* පන්නිපිටිය: කර්තෘ ප්‍රකාශන.

ජයන්ත අමරසූරිය, ටී.පී.එච්.එන්. (2015). *සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට පාසල් සංස්කෘතියේ දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්.* (අප්‍රකාශිත දර්ශනපති නිබන්ධය). කොළඹ විශ්වවිද්‍යාලය.

*Administration, Improving School culture*, http://www.teacherbulletin.org/TBvol8/dipdfs/ Schoolculture.pdf.

An audit of the culture starts with two handy tools, http://www.Schoolculture .net/isdsummer2002.pdf.

Erickson, F. (1987). *Concept of School Culture; An Overview Educational Administration Quarterly*. http://www.schoolculture.net/whatisit.html

Jayasena, P. H. A. N. S. (1995). *School Culture. An Analitical Study of Different Culture Patterns of Adolescent boys and girls in the school setting*. (Unpublished master’s thesis), University of Peradeniya, Sri Lanka.

*School culture Assessment; Training For Facilitators*, http://www .Schoolculture.net/kslfall 2008.pdf.

*School culture survey*, The Indiana Institute For School Leadership Teams.